# බණ්ඩාරවෙල ප්‍රදේශයේ සංචාරක ප්‍රවර්ධනයට දක්වන දායක වන කාර්මික උරුමය

නිරෝෂා උදයංගනී

පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
dm.niroshaudayangani@gmail.com

---

16 වන සියවසෙන් පසුව යුරෝපීය බලපෑම් මත ශ්‍රී ලංකාවේ සංස්කෘතික, සමාජමය හා ආර්ථික වශයෙන් විපර්යාසයන් රැසක් සිදුවිය. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිත රාජ්‍යයක් වීමත් සමගම 18 වන සියවසෙන් පසු මෙතෙක් පැවැති කෘෂි ආර්ථික රටාවෙන් දුරස් වී වැවිලි ආර්ථිකයට ප්‍රවේශ විය. ඒ සමගම වැවිලි කර්මාන්තය, ප්‍රවාහනය, පොදු පහසුකම් හා සන්නිවේදන යන ක්ෂේත්‍රයන්හි වෙනස්කම් ඇතිවන්නට විය. බණ්ඩාරවෙල ප්‍රදේශයේ විසිරී පවතින 1850 - 1950 කාලවකවානුවට අයත් කාර්මික උරුමය එම වෙනස්කම් අතර සුවිශේෂී වේ. බණ්ඩාරවෙල ප්‍රදේශයේ සංචාරක ප්‍රවර්ධනයට දක්වන දායක වන කාර්මික උරුම හඳුනාගැනීම සඳහා ක්‍රියාත්මක කළ මෙම අධ්‍යයනයේ දී ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය යොදා ගත් අතර බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල කලාපය තුළ බණ්ඩාරවෙල නගරයේ සිට හල්දුම්මුල්ල නගරය දක්වා ප්‍රදේශය ක්ෂේත්‍ර අධ්‍යයනයට බඳුන් විය. තේ කර්මාන්තශාලා, දුම්රිය ප්‍රවාහනය, සන්නිවේදන හා පොදු පහසුකම් හා ව්‍යාපාරික ගොඩනැගිලි ප්‍රධාන වශයෙන් අවධානයට ලක් විය.

ශ්‍රී ලංකාවේ කාර්මික උරුමයේ පදනම වනුයේ තේ කර්මාන්තය ය. බණ්ඩාරවෙල, දියතලාව, හපුතල, විහාරගල ප්‍රදේශවල ආරම්භක තේ කර්මාන්ත ශාලා වර්තමානයේත් සක්‍රීය මට්ටමේ දායකත්වය ලබා දෙයි. යන්ත්‍ර සූත්‍ර, ශ්‍රමිකයන් පදිංචි කර වූ ලයිම් නිවාස, කර්මාන්ත ශාලා හිමියන්ගේ නිවාස, වතු ආශ්‍රිත පොදු පහසුකම් වූ වෛද්‍ය මධ්‍යස්ථාන, වතු පාලම් හා සුවිශේෂි කාණු පද්ධති හා ආගමික කෝවිල් වර්තමානයේත් මෙම කලාපය පුරාම දැක ගත හැකිය.

කාර්මික උරුමයන් වූ දුම්රිය සේවාව ආරම්භයත් සමගම ඉදි වූ හපුතල, දියතලාව, බණ්ඩාරවෙල දුම්රිය ස්ථාන දුම්රිය හා සම්බන්ධ උරුමය වර්තමානයේත් දෘශ්‍යමාන ව පවතියි. දොඹකර, වාෂ්ප බල දුම්රිය සඳහා ජලය සැපයූ ජල ටැංකි හා ජල කුළුණු, දුම්රිය මැදිරි හරවන මේස, බීමට ජලය සපයන කරාම, ගබඩා, දුම්රිය මගීන්ගේ නවාතැන් පහසුකම් සඳහා වූ දුම්රිය නැවැතුම්පොළ අසළ ගොඩනැගිල්ල හා දුම්රිය සංඥා පුවරු, සමාගම්වල නාමයන් සහිත උපකරණ මේ අතර ප්‍රධාන වේ. හපුතල පන්කැටිය රෝහල, පන්කැටිය රෝහලේ ජල ටැංකි හා දියතලාව ජල බෙදාහැරීම් මධ්‍යස්ථාන හා ඒ හා සම්බන්ධ උපාංග ගෙන්වූ සමාගම් නාමයන් ද හඳුනාගනු ලැබිණි. හපුතල හා දියතලාව දුම්රිය මධ්‍යස්ථායේ විදුලි ආලෝක කණු, හල්දුම්මුල්ල - හපුතල - දියතලාව නගරවල 1910-1936 පස්වන ජෝර්ජ් රජ සමයට අයත් 'GRV' අක්ෂර සහ ඔටුන්න සහිත තැපැල් කණු දැක ගත හැකිය. ප්‍රභූ නිවාස, හෝටල් හා දැවවලින් නිර්මිත සොල්දොර සහිත වෙළෙඳසල් මෙම ප්‍රදේශයෙන් බහුල ව හඳුනාගැනිණි. බ්‍රිතාන්‍යයන්ගේ තේ වගාව හා ප්‍රවාහනය සමග කාර්මීකරණයේ නව නිර්මාණ බණ්ඩාරවෙල ප්‍රදේශයේ දැක ගත හැකි ය. එම කාර්මික උරුමය කළමනාකරණය කර සංචාරක කර්මාන්තයට දායක කිරීම මාගේ අපේක්ෂාව වේ.

ප්‍රමුඛ පද : කාර්මික උරුමය, බණ්ඩාරවෙල, තේ කර්මාන්තය